ESTABLISHED IN
1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/01/11

## මාධ්‍ය නිවේදනය

**සූතිකාගාරයේ ගොඩ නැගී තිබෙන සේවක අර්බුදය**

දරු ප්‍රසූතිය සම්බන්ධයෙන් ලංකාවේ සූතිකාගාරවල ප්‍රමිතිය ජාත්‍යන්තර ප්‍රමිතිය හා සමගාමීව පවත්වා ගැනීමට අපට හැකි වී ඇති අතර එහි සේවක සංයුතිය වෛද්‍යවරුන් හා වින්නඹු මාතාවන්ගෙන් සැකසී ඇත.

මාතෘ හා ළදරු මරණ සංඛ්‍යා ලේඛන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව ඉතා හොඳ මට්ටමක පවත්වාගෙන යාමට මෙම කාරණය ඉවහල් වූ නමුත් රජයේ රෝහල් වල සූතිකාගාරය අද ගැටළු වලින් තොරව සේවා සලසන ඒකකයකි.

වින්නඹු හා හෙද සේවාව සෞඛ්‍ය සේවයේ ඇති තාක්ෂණික ක්ෂේත්‍ර දෙකකි. මින් වින්නඹු මාතාවන් සූතිකාගාරයේ මෙන්ම ක්ෂේත්‍රයේ ලබා දුන් සේවාව ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල බවත් එය ජාත්‍යන්තර ඇගයීමට ලක්වී ඇති බවත් කවුරුත් දනී. එබැවින් කල යුතුව ඇත්තේ එම ක්ෂේත්‍රය බිඳ දැමීම නොව තව තවත් දියුණු කිරීමයි. එමෙන්ම ගෞරවණීය සේවාවක් සලසන ශ්‍රී ලාංකික හෙදියන් ගේ දියුණුවට අවශ්‍ය කරන පියවර ගත යුතුව ඇත. එබැවින් හෙදියන්ව හෙද සේවයේ වැඩි දුර අධ්‍යාපනය ලබා දීම කල යුතුය. නමුත් හෙදියන්ද වින්නඹු මාතාවන්ගේ සේවාවේ කොටසක් ලෙස පුහුණු කිරීමෙන් හෙද වෘත්තියට හෝ වින්නඹු මාතාවන්ගේ දියුණුවට සෙතක් සලසන්නේ නැත. ඉන් සිදුවන්නේ සේවකයන් අතර ගැටළුවක් නිර්මාණය වීම පමණි.

සූතිකාගාර සම්බන්ධයෙන් වගකීම දරන සූතිකාගාර වෛද්‍යවරුන්ගේ තාක්ෂණික තීරණයද එයයි. අප ප්‍රජා වෛද්‍ය නිලධාරීන්ගේ අනු කමිටුවේ තීරණයද එයයි. ජාත්‍යන්තර ප්‍රමිතියට අනුවද සූතිකාගාරය අයිති වින්නඹු මාතාවන්ටය. නමුත් තාක්ෂණික තීරණයට පටහැනිව යමින් වෘත්තීය සමිති දේශපාලනය අදූරදර්ශීව කටයුතු කරමින් හෙදියන් අනෙකුත් සේවක කණ්ඩායම් සමග ගැටුම් ඇතිකර ගැනීමට කටයුතු කරන අයුරු දක්නට ඇත. මෙම ක්‍රියාවලිය හරහා හෙදියන්ටද අපකීර්තියක් මිස සෙතක් සැලසෙන්නේ නැත.

නිල ඇඳුම අරබයා වසර ගණනාවක් තිස්සේ  සිදු වූ ගැටුමද අප සිහිපත් කරමු. මෙම සියළු කාරණා වලින් සිදුවන්නේ දියුණු කල යුතුවූ සෞඛ්‍ය සේවය ගැටුම් වලට ඇද දැමීම නිසා සෞඛ්‍ය සේවා බිඳ වැටීමයි.

බෝ නොවන රෝග වලට අභියෝගාත්මකව මුහුණ දීම පසෙක තබා සෞඛ්‍ය අමාත්‍යාංශය  වැරදි අයුරින් වෘත්තීය සමිති දේශපාලනයට යටත්වී වැරදි තාක්ෂණික තීරණයක් ගැනීම සිදු වෙමින් පවතී. මින් සිදුවන්නේ දැනට ස්ථාවරව ඇති සූතිකාගාර සේවාවද බිඳ වැටීමයි.

එබැවින් සියළු පාර්ශව කැඳවා මේ පිලිබඳව සාකච්ජා කරන තෙක් දැනට තිබෙන සේවා සැපයීම් හා පුහුණු කිරීම් වෙනසකට භාජනය නොකරන ලෙස අප කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තූතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර සඳහා : වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516